# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1791/18 - 2013 ජනවාරි මස 02 වැනි බදාදා - 2013.01.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 07 දරන සමාගම් පනත**

2007 අංක 07 දරන සමාගම් පනතේ 477 වන වගන්තිය සමග කියවිය යුතු 527 වන වගන්ති යටතේ කර්මාන්ත හා වානිජ කටයුතු අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝග.

රිෂාඩ් බදියුදීන්,
කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය.

2012 දෙසැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

සමාගම් (ගාස්තු) නියෝග

2011 අගෝස්තු 22 වැනි දිනැති *අංක 1720/02 දරන අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් පළකරන ලද සමාගම් (ගාස්තු) නියෝග පහත උපලේඛනයේ දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**උපලේඛනය**

| *අනු අංකය* | *2007 අංක 07 දරන සමාගම් පනත* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| 1 | සීමා සහිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 15,000.00 |
| 2 | සීමා රහිත සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 12,500.00 |
| 3 | ඇපයෙන් සීමාසහිත ලියාපදිංචි කිරීම සඳහා | රු. 25,000.00 |
| 4 | උකස්කර බැඳීම් හා ණය පත්‍ර ලියාපදිංචි කිරීම සඳහා | රු. 5,000.00 |
| 5 | වාර්ෂික වාර්තාවක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 5,000.00 |
| 6 | දේපළ භාර ගැනුම්කරුවකු හෝ කළමනාකරුවකු හෝ අද්මිනිස්ත්‍රාත්සිකරුවකු හෝ ඈවරකරුවකු විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට භාර දිය යුතු යැයි නියම කරනු ලැබ ඇති දැන්වීම් සහ වාර්තා හැර ලියාපදිංචි කළ යුතු යැයි නියම කරන ලද හෝ බලය දෙන ලද හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට භාර දිය යුතු යැයි, යැවිය යුතු යැයි දිය යුතු යැයි හෝ ඉදිරිපත් කළ යුතු යැයි හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ගොනු කළ යුතු යැයි හෝ නියම කරන ලද යම් ලේඛනයක් ලියාපදිංචි කිරීම | රු. 1,000.00 |
| 7 | සමාගමක නාමයක් අනුමත කිරීම සඳහා | රු. 1,000.00 |

**උපලේඛනය (සම්බන්ධිතයි)**

| *අනු අංකය* | *2007 අංක 07 දරන සමාගම් පනත* | *සංශෝධිත ගාස්තුව* |
|---|---|---|
| 8 | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් තබාගෙන ඇති ලිපි ගොනුවක් පරීක්ෂා කිරීම සඳහා | රු. 500.00 |
| 9 | සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යොමු කර ඇති යම්කිසි ලේඛනයක් හෝ එහි උධෘතයක් සහතික කිරීම සඳහා | රු. 500.00 |
| 10 | බැඳුම්කර ලේඛනය පරීක්ෂා කිරීම සඳහා | රු. 500.00 |
| 11.1 | සමාගම් ලේකම්වරු ලෙස තනි පුද්ගලයින් ලියාපදිංචි කිරීම | රු. 2,500.00 |
| 11.2 | සමාගම් ලේකම්වරු ලෙස තනි පුද්ගල ව්‍යාපාර/හවුල් ව්‍යාපාර ලියාපදිංචි කිරීම | රු. 5,000.00 |
| 11.3 | සමාගම් ලේකම්වරු ලෙස සී/ස සමාගම් ලියාපදිංචි කිරීම | රු. 5,000.00 |
| 12 | අක්වෙරළ සමාගමක් සිය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා වියදම් වෙනුවෙන් බැංකුවක බැර කළ යුතු ප්‍රමාණය | ඇ.ඩො.100,000.00 |
| 13 | අක්වෙරළ සමාගමක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 100,000.00 |
| 14 | විදේශ සමාගමක් විසින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ස්ථානයක් ලියාපදිංචි කිරීම සඳහා | රු. 50,000.00 |
| 15.1 | 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ජනතා සමාගමක් වශයෙන් ගැමිදිරිය සමාගම් යෝජනා ක්‍රමය යටතේ පිහිටුවන ලද සමාගමක් නැවත ලියාපදිංචි කිරීම සඳහා | රු. 2,000.00 |
| 15.2 | වෙනත් යම් පවත්නා සමාගමක් (විදේශ සමාගමක් හැර) නැවත ලියාපදිංචි කිරීම සඳහා | රු. 10,000.00 |
| 15.3 | අක්වෙරළ සමාගමක් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා එහි ලියාපදිංචිය අලුත් කිරීම | රු. 100,000.00 |

01 - 474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.